JMC vLearning
"your virtual learning partner"

# හවුල් ව්‍යාපාර නීතිය - Partnership Law

නදීකා ජයසිංහ

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

### හවුල් ව්‍යාපාර අර්ථ නිරූපණය

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ (1) වැනි වගන්තියට අනුව හවුල් ව්‍යාපාරයක් යනු ලාභ ලැබීමේ අරමුණින් පොදුවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාවක් ලෙස හැඳින්විය හැකිය.

මෙම නිර්වචනයට අනුව හවුල් ව්‍යාපාරයක් ඇතිවීම සඳහා පැවතිය යුතු මූලිකාංග කිහිපයකි. එනම්,

- ලාභ ලැබීමේ අරමුණක් තිබීම
- කිසියම් ව්‍යාපාර කටයුත්තක් තිබීම
- පුද්ගලයන් කිහිපදෙනෙකු සිටිය යුතුය
- පුද්ගලයන් අතර සම්බන්ධතාවයක් පැවතිය යුතුය

### හවුල් ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ

1) මූලික පරමාර්ථය ලාභ ලැබීම වේ.
2) අයිතිය (ස්වාමීත්වය) හවුල්කරුවන් සතුවීම.
3) අයිතිය පැවරීම - හවුල්කරුවකුට ඇති අයිතියක් වෙනත් තැනැත්තෙකුට නිදැල්ලේ පැවරිය නොහැක. ඒ සඳහා අනෙකුත් හවුල්කරුවන්ගේ කැමැත්ත තිබිය යුතුය.
4) හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම. එනම් හවුල් ව්‍යාපාරයේ බැරකම් හවුල්කරුවන්ගේ පුද්ගලික දේපළ වලින් හෝ ගෙවා දැමීමට හවුල්කරුවන් තනි තනිවත්, සාමූහිකවත් බැඳී සිටී.
5) හවුල් ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නොමැති වීම. එනම් හවුල නීතිය ඉදිරියේදී කෘතිම පුද්ගලයෙකු වශයෙන් නොසලකයි. මේ නිසා නඩු පැවරීම හා පවරනු ලැබීම කළ යුත්තේ හවුල් ව්‍යාපාරයේ නමින් නොව හවුල්කරුවන්ගේ නම් වලිනි.
6) හවුල් ව්‍යාපාරික කටයුතු හවුල්කරුවන් විසින්ම සංවිධානය කිරීම.
7) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම. එනම් හවුල්කරුවෙක් මියයාම, උමතු වීම වැනි හේතූන් මත හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට සිදුවීම.
8) අවම සාමාජික සංඛ්‍යාව 02 ක් වන අතර උපරිමය 20 කි.
9) ප්‍රාග්ධනය යෙදීම හවුල්කරුවන් විසින් කරනු ලබන අතර පොදු ප්‍රාග්ධනය වෙනස් කිරීම හවුල්කරුවන්ගේ අභිමතය පරිදි කළ හැකි වීම.
10) ගිණුම් තැබීම හා විගණනය අනිවාර්ය නොවීම.
11) හවුල් ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් අවශ්‍ය නොවන අතර හවුල්කරුවන්ගේ පුද්ගලික නම් වලින් බදු ගෙවිය යුතු වීම.
12) විසුරුවා හැරීම ස්වේච්ඡාවෙන් හා අධිකරණයක් මගින් යනාදී වශයෙන් දෙආකාරයකට කළ හැකි වීම.

### ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වන විශේෂිත නීතිරීති

ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර වලට බලපාන නීතිය ඉංග්‍රීසි නීතිය මත පදනම්ව සකස් වී ඇති බව 1852 අංක 05 දරණ සිවිල් නීති ආඥා පනතේ 3 වන වගන්තියේ සඳහන් වේ. මේ අනුව ශ්‍රී ලංකාවේදී හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වන්නා වූ නීතිරීති සමුදායක් පහත පරිදි දැක්විය හැකිය.

**1) ව්‍යාපාර නාම ආඥා පනත**

1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සම්බන්ධව අදාළ වේ. (ඉහත පනතට 1987 අංක 07 දරණ ව්‍යාපාර නාම පනත වශයෙන්


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

සංශෝධනය කර තිබුණ ද එය දැනට තවම අක්‍රීයව පවතී) යම් හවුල් ව්‍යාපාරයක් හවුල්කරුවන්ගේ සත්‍ය සම්පූර්ණ නාමයෙන් පවත්වාගෙන නොයෙන විට මෙම පනත යටතේ ලියාපදිංචි කළ යුතුය.

### 2) 2007 අංක 07 දරණ සමාගම් පනතේ 519 වැනි වගන්තිය

මෙම පනතට අනුව ශ්‍රී ලංකාව තුළ පුද්ගලයන් විසි දෙනාට වැඩි හවුල් ව්‍යාපාර තහනම් කෙරේ. මේ නිසා හවුල් ව්‍යාපාරයකට උපරිම හවුල්කරුවන්ගේ සංඛ්‍යාව තීරණය වන්නේ සමාගම් පනතට අනුවයි.

### 3) 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥා පනතේ 18 වැනි වගන්තිය

ශ්‍රී ලංකාව තුළ අරඹන හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000 ක් හෝ ඊට වඩා වැඩි අවස්ථා වලදී එකී හවුල් ව්‍යාපාරය ලිඛිත ගිවිසුමක් යටතේ ආරම්භ කළ යුතු බව දැක්වේ.

### 4) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් විශේෂ නීතියක් අදාළ නොවන අවස්ථා වලදී මෙම එංගලන්ත හවුල් ආඥා පනතේ විධිවිධාන අදාළ වේ.

### 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වැනි වගන්තියේ අඩංගු විධිවිධාන

I. සෑම හවුල්කරුවෙක්ටම ව්‍යාපාරයේ ප්‍රාග්ධනය පිළිබඳ සමාන අයිතියක් ඇති අතර ලාභ අලාභ සම සමව විඳදරා ගත යුතුය.

II. හවුල්කරුවෙක් ව්‍යාපාරයේ නිවැරදි පැවැත්ම උදෙසා පෞද්ගලිකව දරන ලද වියදමක් වේ නම්, ව්‍යාපාරය විසින් එම වියදම එකී හවුල්කරුට ගෙවිය යුතුය.

III. හවුල්කරුවන් විසින් යෙදූ ප්‍රාග්ධනයට පොළිය ගෙවිය නොහැකිය.

IV. යම් හවුල්කරුවෙක් ප්‍රාග්ධනයට අතිරේකව යොදන ලද මුදල් වෙනුවෙන් අවම වශයෙන් 5% ක වාර්ෂික පොළියක් ගෙවිය යුතුය.

V. සෑම හවුල්කරුවෙක්ම ව්‍යාපාරයේ කළමනාකරණය සඳහා සක්‍රීය ලෙස සහභාගී විය යුතුය.

VI. කිසිම හවුල්කරුවෙකුට කළමනාකරණයට සහභාගී වීම වෙනුවෙන් වැටුප් ගෙවිය නොහැක.

VII. අලුතින් හවුල්කරුවෙක් ව්‍යාපාරයට බඳවා ගැනීමට නම් ඒ සඳහා සිටින සියලුම හවුල්කරුවන් ඊට කැමති විය යුතුය.

VIII. ව්‍යාපාරයේ පොත්පත් ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේම පවත්වා ගත යුතුය.

IX. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු පිළිබඳ තීරණ වැඩි දෙනාගේ කැමැත්ත මත ගත හැකි වන අතර ව්‍යාපාරයේ මූලික ස්වභාවය වෙනස් කිරීම පිළිබඳ තීරණයක් ගත යුතු විටෙකදී එය සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත මත විය යුතුය.

### 5) 1953 වස්තුභංගත්ව පනත

හවුල්කරුවෙකු බංකොලොත් වුවහොත් මෙම වස්තුභංගත්ව පනත අනුව ක්‍රියා කළ යුතුය.

### 6) 2007 අංක 06 දරණ දේශීය ආදායම් පනත


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් ආදායම් බදු ගෙවීම පිළිබඳ විධිවිධාන මෙහි දැක්වේ. එනම් හවුල් ව්‍යාපාරයක් හවුල් ව්‍යාපාරයේ නමින් බදු ගෙවීමක් අවශ්‍ය නොවන අතර හවුල්කරුවන්ගේ පුද්ගලික නම් වලින් බදු ගෙවිය යුතුය.

**7) සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ ඇතැම් වගන්ති**

උදාහරණ:- මෙහි 64 වන වගන්තියට අනුව හවුල්කරුවන්ට සිතාසි භාරදීම පිළිබඳව නියමයක් දක්වයි.

**8) ගානර් එදිරිව මරේ නඩු තීන්දුව**

යම් හවුල්කරුවෙක් වස්තු භංගත්වයට පත්වුවහොත් එම හවුල්කරුවාගේ බංකොලොත් කොටස ශේෂ හවුල්කරුවන් විසින් ඔවුන්ගේ අවසාන ශේෂ පත්‍රයේ ප්‍රාග්ධන අනුපාතය අනුව බෙදාගත යුතුය.

හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් බලපාන ඉහත සඳහන් කර ඇති විශේෂිත නීති රීති වලට අමතරව පොදුවේ ඕනෑම ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අදාළ වන අනෙකුත් නීතිරීති ද හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් අදාළ වේ.

උදාහරණ:- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, 1984 අංක 06 දරණ ශ්‍රී ලංකා ප්‍රමිත ආයතන පනත, ගිවිසුම් නීතිය, නියෝජ්‍යත්ව නීතිය.

## හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකි ආකාරයන්

හවුල් ව්‍යාපාරයක් වූ කලි ගිවිසුමක් වේ. ගිවිසුමක් යනු නීත්‍යානුකූල අරමුණක් වෙනුවෙන් නීත්‍යානුකූළ ප්‍රතිඵල අපේක්ෂාවෙන් පාර්ශවකරුවන් දෙදෙනෙක් හෝ ඊට වඩා වැඩි පිරිසක් අතර ඇති කරගනු ලබන එකඟතාවක් ලෙස හැඳින්විය හැකිය. මේ අනුව හවුල් ව්‍යාපාරයක් ගිවිසුමක් වන හෙයින් ගිවිසුමක් ආරම්භ කරන ආකාරයට අනුව හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළ හැකිය. ගිවිසුමක් ඇරඹිය හැකි ක්‍රම තුනකි. එනම්,

1) ඇඟවීමෙන් (වටහාගත හැකි වන පරිදි)

2) වාචිකව (කට වචනයෙන්)

3) ලිඛිතව

කෙසේ නමුත් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා වඩා යෝග්‍ය ක්‍රමය වන්නේ හවුලක් ලිඛිතව ආරම්භ කිරීමයි.

යම් හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000 ක් හෝ ඊට වඩා වැඩිවන විටකදී හවුලක් ලිඛිත ගිවිසුමක් යටතේ පවත්වාගත යුතු වන බව 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වැනි වගන්තියේ ප්‍රකාශ වේ.

## හවුල් ව්‍යාපාරයක් ලිඛිතව ආරම්භ කිරීම

හවුල්කරුවන් විසින් හවුලක් ලිඛිතව ආරම්භ කිරීම සඳහා හවුල් ඔප්පුවක් නැතහොත් හවුල් ගිවිසුමක් නැතහොත් හවුල් ව්‍යවස්ථාවලියක් සකසා ගත යුතුය. එකී ව්‍යවස්ථාව, ඔප්පුව නැතහොත් ගිවිසුම ලිඛිත විය යුතු අතර, සියලුම හවුල්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් එකී ඔප්පුව, ගිවිසුම නැතහොත් ව්‍යවස්ථාවට කැමැත්ත ප්‍රකාශ කර අත්සන් තැබිය යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## හවුල් ව්‍යවස්ථාවලිය (හවුල් ඔප්පුව / හවුල් ගිවිසුම)

හවුල් ව්‍යාපාරයකට සම්බන්ධ සියලුම හවුල්කරුවන් විසින් එකඟවන්නා වු තොරතුරු මාලාවක් යම්කිසි ආකාරයකට ලියා සකසා එයට සම්මුතිය (කැමැත්ත) පල කරමින් සියලුම හවුල්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් හවුල් ඔප්පුවක් ලෙස හැඳින්විය හැකිය.

## හවුල් ඔප්පුවක අඩංගු කරුණු

1) හවුල් ව්‍යාපාරයේ නම
2) හවුල්කරුවන්ගේ නම් හා ලිපිනයන්
3) හවුල් ව්‍යාපාරයේ පරමාර්ථ
4) එක් එක් හවුල්කරුවන් විසින් යොදන ලද ප්‍රාග්ධනය
5) හවුල් ව්‍යාපාරයේ ස්වභාවය
6) හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ විභජනය කරන ආකාරය
7) හවුල්කරුවන්ට වැටුප් ගෙවන ආකාරය
8) ප්‍රාග්ධනයට පොළී ගෙවන්නේ නම් එය කෙසේද යන්න
9) හවුල්කරුවන් ප්‍රාග්ධනයට අතිරේඛව යෙදු මුදල් සඳහා පොළී ගෙවන ආකාරය
10) හවුල්කරුවන්ගේ ගැනිලි සඳහා වු කොන්දේසි
11) හවුල් ව්‍යාපාරයේ කටයුතු කළමනාකරණය කරන ආකාරය
12) හවුල් ව්‍යාපාරය තුළ ඇතිවන ආරවුල් විසඳා ගන්නා ආකාරය
13) ගිණුම් තබන ආකාරය
14) හවුල්කරුවකු බඳවා ගැනීම හා විශ්‍රාම ගැනීම පිළිබඳ විධිවිධාන
15) හවුල් ව්‍යාපාරය විසුරුවා හරින ආකාරය

## හවුල් ව්‍යාපාරයකට හවුල් ඔප්පුවක් නැතහොත් ව්‍යවස්ථාවලියක් පැවතීම වැදගත් වීමට හේතු

1) හවුල්කරුවන් අතර නිතර නිතර ආරවුල් ඇති නොවන පරිදි හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යාමට හැකිවීම.
2) හවුල්කරුවන් අතර ඇතිවන ආරවුල් පහසුවෙන් විසඳාගත හැකිවීම.
3) නීතිය ඉදිරියේදී සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කළ හැකි වීම.
4) බාහිර පාර්ශවයන්ට හවුලක් පවතින බව ඔප්පු කළ හැකි වීම.
5) අධිකරණය වෙත නොගොස් ආරවුල විසඳාගත හැකි වීම.
6) හවුල් ව්‍යාපාරය කෙරේ බාහිර පාර්ශවයන්ගේ පිළිගැනීමක් ඇති වීම.
7) කොටි කාලයක් තුළදී ගැටලු ප්‍රශ්න සම්බන්ධයෙන් හවුල් ඔප්පුව අනුව විසඳුමක් ලබාගත හැකිවීම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### හවුල්කරුවන් අතර ආරවුලක් ඇති වුවහොත් එය විසඳා ගැනීම වෙනුවෙන් අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියාමාර්ග

1) හවුල්කරුවන් අතර හවුල් ගිවිසුමක් නැතහොත් හවුල් ඔප්පුවක් තිබේ නම් එම ඔප්පුවට අනුව ආරවුල විසඳා ගැනීම. එසේ නොමැති නම් හවුල්කරුවන්ගේ කැමැත්තෙන් විසඳා ගැනීම.
2) බේරුම්කරුවකු (තීරකයෙකු) මගින් ආරවුල විසඳා ගැනීම.
3) හවුල් ගිවිසුමක් නොමැත්තේ නම් 1890 හවුල් ආඥා පනතේ 24 වැනි වගන්තියේ අඩංගු විධි විධානයන්ට අනුව ක්‍රියා කිරීම.
4) ආරවුල අධිකරණයක් වෙතට යොමු කිරීම.

### හවුල් ව්‍යාපාරයක ආරවුලක් තීරකයෙක් මගින් විසඳා ගැනීම

හවුල්කරුවන් අතර ආරවුලක් හටගත් විටෙක එය විසඳා ගැනීම සඳහා යොමු කළ යුතු බාහිර පාර්ශවයකුගේ නමක් හවුල් ඔප්පුවේ සඳහන් කොට තිබී එකී බේරුම්කරු වෙතට ආරවුල ඉදිරිපත් කොට විසඳුමකට එළඹීම තීරකයෙක් මගින් ආරවුල විසඳා ගැනීම ලෙස හැඳින්විය හැක.

### අධිකරණයක් වෙතට නොගොස් තීරකයෙක් මගින් ආරවුල විසඳා ගැනීමේ වාසි සහගත තත්ත්වයන්

- අධිකරණයක් වෙතට යාමේදී මෙන් අධික වියදමක් මෙහිදී දැරීමට සිදු නොවීම.
- කල්නෙයා කෙටි කාලයක් තුළදී ඉක්මන් තීරණයක් ගැනීමට හැකියාව ලැබීම.
- නඩු පැවරීමකදී මෙන් කීර්තිනාමය කෙරෙහි අහිතකර බලපෑම් ඇති නොවීම.

### හවුල්කරුවන්ගේ වගකීම් - Responsibilities of Partners

- හවුල් ව්‍යාපාරයේ ණය තුරුස් පුද්ගලික දේපළවලින් හෝ ගෙවීමට හෝ සාමූහිකව ගෙවීමට ඇති බැඳීම.
- සාමාන්‍ය හවුල් ව්‍යාපාර කටයුතු වලදී කිසියම් හවුල්කරුවකු අන් හවුල්කරුවන්ගේ අනුමැතිය සහිතව සිදුකරනු ලබන සිවිල් වරදකදී සියලුම හවුල්කරුවෝ සාමූහිකව හෝ වෙන් වෙන්ව වගකීමට ඇති බැඳීම.
- කිසියම් හවුල්කරුවෙක් භාරයේ පවතින හවුල් දේපළ පිළිබඳව අනෙක් හවුල්කරුවන් වගකීමට ඇති බැඳීම.
- හවුල්කරුවෙක් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් සිදු කරනු ලබන කටයුත්තකට අදාළව නියෝජිතයෙකු වශයෙන් ඇතිවන වගකීම.

### හවුල්කරුවන්ගේ යුතුකම් - Duties of Partners

- උපරිම විශ්වාසය ආරක්ෂා කිරීමේ යුතුකම.
- රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ යුතුකම.
- රහස් ලාභ නොලැබීමේ යුතුකම.
- තරඟකාරී ව්‍යාපාර නොපැවැත්වීමේ යුතුකම.
- අදාළ හවුල් ව්‍යාපාර කටයුතු වලදී යම් හවුල්කරුවකු ලැබූ මුදල් සහ කළ වියදම් පිළිබඳව අනෙක් හවුල්කරුවන්ට සත්‍ය ගිණුම් ඉදිරිපත් කිරීමේ යුතුකම.
- හවුල් ව්‍යාපාරයේ කටයුතු වලට උපරිම ලෙස දායක වීමේ යුතුකම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- අනෙක් හවුල්කරුවන්ගේ අවසරයක් නොමැතිව යම් හවුල්කරුවකු විසින් හවුල් ව්‍යාපාරයේ දේපළක, හවුල් ව්‍යාපාරික සම්බන්ධතාව හෝ හවුලේ කීර්තිනාමය උපයෝගී කරගෙන යම් වාසියක් හෝ ලාභයක් ලබා ඇත්නම් එය හවුල් ව්‍යාපාරය වෙත පවරාදීමේ යුතුකම.

## හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් - Rights of Partners

- ශුද්ධ ලාභයෙන් කොටසක් ලැබීමට ඇති අයිතිය.
- ව්‍යාපාරයේ පොත්පත් ලිපි ලේඛන පරීක්ෂා කිරීමට ඇති අයිතිය.
- ව්‍යාපාරය වෙනුවෙන් පෞද්ගලිකව දැරූ වියදමක් අයකර ගැනීමට ඇති අයිතිය.
- ප්‍රාග්ධනයට අතිරේකව යෙදූ මුදල් සඳහා අවම වශයෙන් 5% ක වත් පොළියක් ලැබීමට ඇති අයිතිය.
- ගණුදෙනු කළ හැකි ලියවිලි සැකසීම, අත්සන් කිරීම හා පිටසන් කිරීමට ඇති අයිතිය.
- හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු වලට සම්බන්ධ වීමට ඇති අයිතිය.
- හවුල විසුරුවා හරින ලෙස යෝජනා කිරීමට ඇති අයිතිය.

## හවුල්කරුවකුට කළ නොහැකි කාර්යයන්

1) හවුල් ව්‍යාපාරය වෙනුවෙන් ඔප්පුවක් ලියා අත්සන් කළ නොහැකි වීම.
2) හවුල් ව්‍යාපාරයට ලැබිය යුතු ණය මුදලකට හිලව් වීම සඳහා දේපළක් පවරාගත නොහැකි වීම.
3) හවුල් ව්‍යාපාරයේ නම පාවිච්චි කිරීමට තෙවන පාර්ශවයකට බලය දිය නොහැකි වීම.
4) හවුලේ හවුල්කරුවෙක් වෙනත් ව්‍යාපාරයක හවුල්කරුවෙක් බවට පත්කළ නොහැකි වීම.

## හවුලක් විසුරුවා හැරීමෙන් පසු වත්කම් විභාජනය කරන ආකාරය

1) බාහිර ණය ගෙවීම.
2) හවුල්කරුවන් ප්‍රාග්ධනයට අතිරේකව යෙදූ මුදල් ආපසු ගෙවීම.
3) එක් එක් හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධනය ආපසු ගෙවීම.
4) ඉතිරියක් වේ නම් හවුල්කරුවන් ලාභ අලාභ බෙදාගන්නා අනුපාතයට බෙදා ගැනීම

## හවුල්කරුවකුගේ නියෝජිතභාවය

හවුල් ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇති වූ වහාම හවුල්කරුවන් අතර අන්‍යොන්‍ය වශයෙන් නියෝජ්‍යත්වයක් ඇති වුවා සේ සලකනු ලබයි. යම් හවුල් ව්‍යාපාරයක ව්‍යාපාරික කටයුතු ඇතුලත ක්‍රියාකරමින් යම් හවුල්කරුවකු යම් හවුල් ගිවිසුමකට ඇතුලත් වී නම්, එකී හවුල්කරු සැලකෙන්නේ අනෙක් හවුල්කරුවන්ගේ නියෝජිතයෙක් ලෙසය. එසේ වුවද මෙවන් අවස්ථාවලදී වෙනත් නියෝජිතයන්ට වඩා වෙනස්කමක් ඉස්මතු වේ. එනම් එම හවුල්කරු හැසිරෙන්නේ අනෙක් හවුල්කරුවන්ගේ නියෝජිතයෙක් ලෙස පමණක් නොව එකී හවුල්කරු එම ගිවිසුමට අදාළව ප්‍රධානියා ලෙසද සලකනු ලැබේ. මේ නිසා හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකුට ද්විත්ව චරිතයක් ඇති බව ප්‍රකාශ කළ හැකිය.

උදාහරණ:- A, B, C යන තිදෙනා P සමාගම නමින් එළවළු මිලදී ගැනීමේ සහ විකිණීමේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. එම ව්‍යාපාරික කටයුතු ඇතලත ක්‍රියාකරමින් C විසින් Z ගෙන් ණයට එළවළු තොගයක් මිලට ගැනීමට Z සමග ගිවිසුමකට ඇතුලත් වෙයි. මෙම ගිවිසුමෙන් A, B, C යන තිදෙනාම බැඳීමකට යටත් වේ. මන්ද C සැලකෙන්නේ A හා B ගේ නියෝජිතයා වශයෙන් පමණක් නොව එම ගිවිසුමේ ප්‍රධානියෙකු ලෙසිනි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම - Termination of Partnership
## (හවුල් ව්‍යාපාරයක් අවසන් විය හැකි විවිධ ක්‍රම)

හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාරික කටයුතු අවසන් කොට ගණන් බේරා ගිණුම් පොත් පත් වසා දැමීම හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම ලෙස හැඳින්විය හැකිය. හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරීම ක්‍රම දෙකකට කළ හැකිය. එනම්,

1) හවුල්කරුවන්ගේ ස්වෙච්ඡාවෙන් විසුරුවා හැරීම
2) අධිකරණයක් මගින් විසුරුවා හැරීම

### හවුල්කරුවන්ගේ ස්වෙච්ඡාවෙන් හවුල විසුරුවා හැරීම

හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර කටයුතු අවසන් කොට ගණන් බේරා ගිණුම් පොත්පත් වසා දමා හවුල්කරුවන් අධිකරණයක් වෙතට නොගොස් හවුල්කරුවන්ගේ කැමැත්ත මත සිදු කරයි නම් එය හවුල්කරුවන්ගේ ස්වෙච්ඡාවෙන් හවුල විසුරුවා හැරීමක් ලෙස හැඳින්විය හැකිය.

### හවුල්කරුවන්ගේ ස්වෙච්ඡාවෙන් හවුලක විසුරුවා හැරිය හැකි අවස්ථා

1) හවුල් ව්‍යාපාරයක නිශ්චිත කාලයකට අරඹා එම කාලය ඉකුත්වීමෙන්
2) නිශ්චිත පරමාර්ථයක් වෙනුවෙන් හවුල අරඹා එම පරමාර්ථය ඉෂ්ඨ වීමෙන්
3) හවුල්කරුවෙක් මියයාම මත.
4) හවුල්කරුවෙකු බුන්වත් වීම මත.
5) එක් හවුල්කරුවෙක් හවුල විසුරුවා හැරීමට යෝජනා කර සෙසු හවුල්කරුවන් ඊට කැමති වු විට.
6) හවුල් ව්‍යාපාරය නීති විරෝධී බවට පත් වු විට.
7) එක් හවුල්කරුවෙක් තමාගේ පෞද්ගලික ණයක් වෙනුවෙන් හවුල් ව්‍යාපාරයෙන් තමාට හිමි කොටස පුද්ගලික වැය බරක් කළ අවස්ථාවක.

### අධිකරණයක් මගින් විසුරුවා හැරීම

හවුල්කරුවන්ගේ ස්වෙච්ඡාවෙන් හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමක් කළ නොහැකි විටකදී හවුල් ව්‍යාපාරය පිහිටි දිස්ත්‍රික්කයේ දිසා අධිකරණයක් මගින් දෙනු ලබන තීන්දුවක් අනුව හවුල් ව්‍යාපාර කටයුතු අවසන් කොට ගිණුම් පොත් පත් වසා දමා හවුල විසුරුවා හැරීම අධිකරණයක් මගින් හවුල විසුරුවා හැරීමක් ලෙස හැඳින්විය හැකිය.

### අධිකරණ නියෝගයක් යටතේ හවුලක් අවසන් කළ හැකි අවස්ථා

1) හවුල්කරුවෙක් උමතුවෙන් පෙලෙන බව අධිකරණයට ඒත්තු ගැන්වීමෙන්.
2) හවුල පවත්වාගෙන යා හැක්කේ දිගින් දිගටම පාඩු පිට පමණක් නම්.
3) හවුල්කරුවෙක් නිතර නිතර හවුල් ගිවිසුම කඩකරයි නම්.
4) අන්‍යොන්‍ය විශ්වාසය නැති වී හවුල්කරුවන් අතර ආරවුලක් පවත්නා විට.
5) හවුල්කරුවකුට ගිවිසුම යටතේ තම කටයුතු ස්ථිරවම ඉටුකිරීමට නොහැකි වු අවස්ථාවක.
6) හවුල්කරුවෙක් හවුලට අගතියක් ඇතිවන ආකාරයට ක්‍රියාකරයි නම්.
7) හවුල අධිකරණය මගින් විසුරුවා හැරිය යුතු බවට හවුල්කරුවකු විසින් කරන ඉල්ලීමක් මත.
8) හවුල විසුරුවා හැරීම යුක්ති සහගත හා සාධාරණ යයි උසාවියට හැඟෙන ඕනෑම අවස්ථාවක උදා: Carmichael vs. Evans නඩුවේදී, හවුල්කරුවකු ප්‍රවේශ පත්‍රයක් නොමැතිව දුම්රියෙන් ගමන් කිරීම මත හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට සිදුවූයේ අදාළ හවුල්කරුගේ වැරදි ක්‍රියාව හවුල් ව්‍යාපාරයේ පැවත්මට හානිදායක වූ නිසාය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd